සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2020
# බුද්ධ ධර්මය - I

10 ශ්‍රේණිය — කාලය පැය 01 යි.

නම/ විභාග අංකයː

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

01. බුදු දහමේ මූලික ඉගැන්වීම් අතර පටිච්ච සමුප්පාදයට ප්‍රධාන තැනක් හිමි වේ. පටිච්ච සමුප්පාදය හඳුන්වන තවත් නමක් වන්නේ,
   (1) ඊශ්වර නිර්මාණවාදය නමිනි. (2) ආත්මවාදය නමිනි.
   (3) හේතුඵලවාදය නමිනි. (4) පුබ්බේකත හේතුවාදය නමිනි.

02. වෙනත් කර්මයකින් වළකාලිය නොහැකි වඩාත් ශක්තිමත් බලසම්පන්න කුසලාකුසල කර්මයෝ හඳුන්වනු ලබන්නේ,
   (1) ගරුක කර්ම නමිනි. (2) ආසන්න කර්ම නමිනි.
   (3) ආචිණ්ණ කර්ම නමිනි. (4) කටත්තා කර්ම නමිනි.

03. බුදු දහමේ ඉගැන්වෙන පඤ්චස්කන්ධය යනු,
   (1) පඨවි, ආපෝ, තේජෝ, වායෝ, සුබ යනුයි. (2) රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යනුයි.
   (3) කාලය, දීපය, දේශය, කුලය, මව යනුයි. (4) ඇස, කන, නාසය, දිව, ශරීරය යනුයි.

04. ''ඔබ දෙවියෙක්ද, ගාන්ධර්වයෙක් ද, යක්ෂයෙක් ද, මනුෂ්‍යයෙක් දැයි'' බුදු රජාණන් වහන්සේගෙන් විමසා සිටියේ,
   (1) ජානුස්සෝණි බමුණාය. (2) සෝණදණ්ඩ බමුණාය.
   (3) සොත්ථිය බමුණාය. (4) දෝණ බමුණාය.

05. සිදුහත් කුමාරයාට ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වූ බමුණු පඬිවරයා,
   (1) කාල දේවල නම් වේ. (2) සර්ව මිත්‍ර නම් වේ.
   (3) කොණ්ඩඤ්ඤ නම් වේ. (4) භාර්ගව නම් වේ.

06. ''ආරභථ නික්ඛමථ - යුඤ්ජථ බුද්ධ සාසනේ.....'' යන ගාථා පාඨය ඇතුළත් සූත්‍රය වන්නේ,
   (1) දම්සක් පැවතුම් සූත්‍රය (2) මංගල සූත්‍රය
   (3) අරුණවතී සූත්‍රය (4) වනරෝප සූත්‍රය

07. බඹරා මල නොතලා රොන් ගන්නා සේ සමාජයට බරක් නොවිය යුතු පිරිස වන්නේ,
   (1) භික්ෂූන් වහන්සේලා ය. (2) දෙමාපියෝ ය.
   (3) ගුරුවරයෝ ය. (4) උපාසක උපාසිකාවෝ ය.

08. තමා විසින්ම පිළිපැද ඇස් පනා පිට මෙලොව දීම ප්‍රතිඵල දැකගත හැකි බැවින් ධර්මය,
   (1) අකාලික නම් වේ. (2) ඒහි පස්සික නම් වේ.
   (3) ස්වාක්ඛාත නම් වේ. (4) සන්දිට්ඨික නම් වේ.

09. භාවනාව සඳහා යොමු වීමේ දී ඇති නොකර ගත යුතු ගුණාංග අතරට අයත් නොවන්නක් වන්නේ,

(1) ඉන්ද්‍රිය සංවරයයි. (2) සතිසම්පජඤ්ඤයයි. (3) සන්තුට්ඨිතාවයි. (4) මහිච්ඡතාවයයි.

10. භාවනා වඩන පුද්ගලයා තමාගේ චරිතයට අනුව කර්මස්ථානයක් තෝරා ගත යුතුය. එම චරිතවලට අයත් නොවන්නේ,

(1) මෝහ චරිත (2) විතක්ක චරිත (3) සද්ධා චරිත (4) සුදන චරිත

11. ''ගෞතමයන් වහන්ස! ඇතුළත අවුල්ය. පිටත ද අවුල්ය. සත්ව ප්‍රජාව අවුලෙන් වෙළී සිටියි. කවරෙක් නම් මේ අවුල් නිරවුල් කරන්නේද?'' මේ පිළිබඳව බුදුරජාණන් වහන්සේගෙන් විමසුවේ,

(1) සුභ මානවකයාය. (2) දෙවි කෙනෙකුය. (3) කාලාම වැසියෝය. (4) උපතිස්ස පිරිවැජියාය.

12. යථාර්ථය මනා නුවණින් දැකීම පිණිස උපයෝගී වන බෞද්ධ භාවනාව වන්නේ,

(1) සමථ භාවනාවයි. (2) ආනාපානසති භාවනාවයි.

(3) විපස්සනා භාවනාවයි. (4) බුද්ධානුස්සති භාවනාවයි.

13. තමා විසින් කරන ලද සියලු යහපත් ක්‍රියා සිය පින් පොතෙහි සටහන් කර තැබූ රජතුමා වූයේ,

(1) දේවානම්පියතිස්ස රජතුමාය. (2) වළගම්බා රජතුමාය.

(3) දුටුගැමුණු රජතුමාය. (4) මහසෙන් රජතුමාය.

14. මහනුවර යුගයේ පරිහානියට පත් බුදු සසුන නගා සිටුවීම සඳහා සිල්වත් සමාගම පිහිටුවා ගැනීමට මූලිකත්වය ගත් හිමි නම වන්නේ,

(1) මිගෙට්ටුවත්තේ ගුණානන්ද මාහිමියන්ය. (2) වැලිවිට සරණංකර මාහිමියන්ය.

(3) හික්කඩුවේ ශ්‍රී සුමංගල මාහිමියන්ය. (4) රේරුකානේ චන්දවිමල මාහිමියන්ය.

15. යසස් වැඩි දියුණු වී ප්‍රීතිමත් සාර්ථක ජීවිතයක් ගත කිරීමට උපකාරීවන කරුණු ඇතුළත් ධම්මපද ගාථාව වන්නේ,

(1) අචරිත්වා බ්‍රහ්මචරියං...... යන්නයි. (2) නහි වේරේන වේරානි...... යන්නයි.

(3) යාදිසං වපතේ බීජං...... යන්නයි. (4) උට්ඨානවතෝ සතිමතෝ...... යන්නයි.

16. බුදු දහමේ දැක්වෙන පරිදි සිරිත් යන්නෙන් අදහස් කරන්නේ,

(1) නොකළ යුතු අයහපත් දේ නොකිරීමයි. (2) කළයුතු යහපත් දේ කිරීමයි.

(3) කය-වචන දෙකෙහි සංවරයයි. (4) තිදොර සංවර කර ගැනීමයි.

17. තමා කළ හොඳ ක්‍රියා සිහිපත් වී සුගතිය දැක සිහියෙන් යුතුව කළුරිය කළ තැනැත්තා වූයේ,

(1) ධම්මිකය. (2) මිගාරය. (3) භණ්ඩුකය. (4) නකුලපිතාය.

18. සමාජ සම්බන්ධතා පවත්වා ගනිමින් දෙලොව දිනන පිළිවෙත උගන්වන ගිහි විනයේ එන බෞද්ධ සූත්‍ර දේශනාවකි,

(1) වසල සූත්‍රය (2) කාලාම සූත්‍රය (3) සිඟාලෝවාද සූත්‍රය (4) ව්‍යග්ඝපජ්ජ සූත්‍රය

19. බුදු දහමේ උගන්වන සිත කිලිටි කරන අකුසල මූලයක් වන්නේ,

(1) අලෝභ, අදෝස, අමෝහ (2) කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා

(3) සීල, සමාධි, ප්‍රඥා (4) ලෝභ, දෝස, මෝහ

20. සිඟාලෝවාද සූත්‍රයට අනුව උතුරු දිසාවට උපමා කොට ඇති යුතුකම් ඉටු කළ යුත්තේ,
(1) දෙමාපියන්ට ය. (2) ගුරුවරුන්ට ය. (3) හිත මිතුරන්ට ය. (4) පැවිදි උතුමන්ට ය.

21. සමාජයේ සිටින ඇතැම් පුද්ගලයන් ඉතා නොදියුණු අවම පෞරුෂ ඇත්තෝය. ඔවුන් උපමා කර ඇත්තේ,
(1) මඩෙහි ගැලී සිටින නෙළුම් පොහොට්ටු වලටය.
(2) පිපුණු නෙළුම් මල් වලටය.
(3) මඩ ජලය හා සමව සිටින නෙළුම් පොහොට්ටු වලටය.
(4) ජලයෙන් ඉහළට මතු වූ නෙළුම් පොහොට්ටු වලටය.

22. බුදු දහමේ ඉගැන්වෙන සතර සංග්‍රහ වස්තුවලට අයත් වරණය වන්නේ,
(1) මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා
(2) දානය, ප්‍රියවචනය, අර්ථ චර්යාව, සමානාත්මතාව
(3) ඡන්දය, දෝසය, භය, මෝහය
(4) ඡන්ද, චිත්ත, විරිය, විමංසා

23. සියලු ජාතීන්ට පොදු වූ බුදු දහමේ එන ඉගැන්වීම් 03 කි. ඒවා නම්,
(1) සතර සංග්‍රහ වස්තු, සිව්බඹ විහරණ, සතර සංවර ශීලය
(2) සතර සම්‍යක් ප්‍රධාන වීර්ය, ත්‍රිශික්ෂාව, සතර අගති
(3) පංචනීවරණ ධර්ම, අටලෝ දහම, ත්‍රිවිධ්‍යා
(4) චතුරාර්ය සත්‍යය, පටිච්ච සමුප්පාදය, ත්‍රි ලක්ෂණය

24. බුදු දහමට අනුව හටගත් සෑම දෙයක්ම නැතිවීමේ ස්වභාවයෙන් යුක්තය. ඒ අනුව පංචස්කන්ධය උපමා මගින් දක්වන බුදු දහම රූපය දක්වා ඇති උපමාව කුමක් ද?
(1) දිය බුබුලකටය. (2) මිරිඟුවකටය. (3) පෙණ පිඩකටය. (4) කෙසෙල් කඳකටය.

25. බුදු රජාණන් වහන්සේ බුදු වීමෙන් පසු ප්‍රථම උදානයෙන් වදාළේ,
(1) මම සසර නැවත නැවත ඉපදෙමින් පීඩා විඳීමට හේතු වූ තණ්හාව මුලිනුපුටා දැමූවෙමි.
(2) හේතුවකින් ඇති වූ සියල්ල හේතුවක් නිසාම ඇති වේ.
(3) සමගියම යහපති.
(4) කුසල් දහම් වැඩි දියුණු කරන මානසික අභ්‍යාසය භාවනාවයි.

26. බුදු බව ලබාදීමට සෙවණ දුන් ඇසතු වෘක්ෂයට කෘතවේදීත්වය දක්වන ලද්දේ බුද්ධත්වයට පත් වී,
(1) පළමු සතියේය. (2) දෙවන සතියේය. (3) තෙවන සතියේය. (4) සිව්වන සතියේය.

27. ''යෙ ධම්ම හේතුප්පභවා - තේසං හේතුං තථාගතෝ ආහ.....'' යනාදී ගාථාව ප්‍රකාශ කළේ,
(1) කොණ්ඩඤ්ඤ හිමිය. (2) භද්දිය හිමිය. (3) මහානාම හිමිය. (4) අස්සජි හිමිය.

28. ''ආනන්දයෙහි මේ රජගහ නුවර සිත් අලවන සුලුය. එසේම නිග්‍රෝධය සිත් කලුය. චෞර ප්‍රපාතය සිත් කලුය.....'' යනාදී ප්‍රකාශය තුළින් පැහැදිලි වන්නේ,
(1) වස් විසූ ස්ථාන පිළිබඳවය.
(2) පාරිසරික සුන්දරත්වය ඇගයීමට ලක් කළ ස්ථාන පිළිබඳවය.
(3) සක්මන් කිරීම සඳහා භාවිතා කළ ස්ථාන පිළිබඳවය.
(4) සරාගී වඩන ස්ථාන පිළිබඳවය.

29. බුදු රජාණන් වහන්සේ විසින් රෝග වැලදීමට හේතුවන කරුණු අටක් පෙන්වා දී තිබේ. එම දේශනාව කරන ලද්දේ කවුරුන් උදෙසා ද?
(1) මුගලන් හිමි උදෙසාය. (2) ගිරිමානන්ද හිමි උදෙසාය.
(3) මහාකස්සප හිමි උදෙසාය. (4) බිම්බිසාර රජු උදෙසාය.

30. ''සත්හට වන බව දුකට වෙදාණන්.....'' යන පදය ඇතුළත් කාව්‍ය ග්‍රන්ථය වන්නේ,

(1) ලෝකෝපකාරය (2) ලෝවැඩ සඟරාව (3) සිරිත් මල්දම (4) කාව්‍යශේඛරය

31. ''සීමාව ප්‍රමාණය දන ආහාර වැළඳූ විට ආහාර සෙමින් දිරයි. ඔවුන්ගේ ආයුෂ ද වැඩෙන්නේය.'' මෙම කරුණ ඇතුළත් සූත්‍රය වන්නේ,

(1) දෝණපාක සූත්‍රය
(2) ධනියගෝපාල සූත්‍රය
(3) කසීභාරද්වාජ සූත්‍රය
(4) තේවිජ්ජ සූත්‍රය

32. නිකාය භේදයක් ඇති වීමට තුඩුදුන් මෙරට මුල්ම පෞද්ගලික ආරාම පූජාවක් සිදු කළ රජු වන්නේ,

(1) මහසෙන් රජුය. (2) ධාතුසේන රජුය. (3) වළගම්බා රජුය. (4) මුගලන් රජුය.

33. කණිෂ්ක රජ දවස පැවැත් වූ සිව්වන ධර්ම සංගායනාවේ සභාපතිත්වය පැවරුනේ,

(1) පාර්ශව හිමිටය. (2) ධර්මරුචි හිමිටය. (3) වසුමිත්‍ර හිමිටය. (4) වසුබන්ධු හිමිටය.

34. කලාත්මක බවින් අනූන වටදාගෙයකට උදාහරණයක් වන්නේ,

(1) මැදිරිගිරියේ වටදාගේ
(2) ලංකාරාම වටදාගේ
(3) ථූපාරාම වටදාගේ
(4) තිරියාය වටදාගේ

35. මුලදී කැටයම් රහිත වුවද පසුව පුන්කලස, බහිරව රූප හෙවත් වාමන රූප, පෙනය සහිත නාග රූප එක් වී නිර්මාණය වූ කලාකෘතිය වන්නේ,

(1) කොරවක් ගල (2) සඳකඩ පහණ (3) මුරගල (4) වටදාගෙය

36. පොළොන්නරු යුගයේ විශාලතම චිත්‍රාවලිය දක්නට ලැබෙන ස්ථානය වන්නේ,

(1) නිශ්ශංකලතා මණ්ඩපයෙනි.
(2) වටදාගෙයිනි.
(3) සත්මහල් ප්‍රාසාදයෙනි.
(4) තිවංක පිළිමගෙයිනි.

37. ගුරුළුගෝමී පඬිවරයාගේ විශාරද දැනුම ප්‍රකට කරමින් රචිත ධර්ම ග්‍රන්ථය වන්නේ,

(1) ධර්ම ප්‍රදීපිකාවයි.
(2) අමාවතුරයි.
(3) බුත්සරණයි.
(4) සද්ධර්ම රත්නාවලයයි.

38. භාරතීය අලංකාර ශාස්ත්‍රය පදනම් කරගෙන නිර්මාණය වූ සිංහලයේ විශිෂ්ටතම මහාකාව්‍ය කව්සිළුමිණයි. මෙහි කතුවරයා වන්නේ,

(1) ගුරුළුගෝමී පඬිතුමාය.
(2) වෑත්තෑවේ හිමිය.
(3) විද්‍යා චක්‍රවර්තී පඬිතුමාය.
(4) දෙවන පැරකුම්බා නිරිඳුන්ය.

39. අවෙච්චප්පසාද ශ්‍රද්ධාව යනු,

(1) ත්‍රිවිධ රත්නය පිළිබඳ කරුණු දැන ඇති කර ගන්නා පැහැදීමයි.
(2) දැඩි භක්තියෙන් ආගමික වතාවත්වල නියැලීමයි.
(3) බුදුරජාණන් වහන්සේගේ රූප සම්පත්තිය කෙරෙහි පැහැදීමයි.
(4) අමූලිකා ශ්‍රද්ධාවෙන් කටයුතු කිරීමයි.

40. මාස ගණනක් බුදුරදුන් සමඟ එකට සිටිමින් උන්වහන්සේගේ පැවැත්ම පරීක්ෂා කළ අයකු වන්නේ,

(1) සුභ මානවකයාය.
(2) මඝ මානවකයාය.
(3) පිප්ඵලි තරුණයාය.
(4) බ්‍රහ්මායු තරුණයාය.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2020

**10 ශ්‍රේණිය** **බුද්ධ ධර්මය - II** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරාගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

---

(01) (i) බුදුරජාණන් වහන්සේ මංගල ධර්ම දේශනාව දේශනා කරනු ලැබුවේ කුමන ස්ථානයකදී ද?

(ii) බුදුරජාණන් වහන්සේ අම්බට්ඨ, සිංසපා සූත්‍ර දේශනා කළ ස්ථාන දෙක නම් කරන්න.

(iii) ''රහසක් පව් නොකොට - කෙලෙසරයනුත් දුරු කොට'' කවිය සම්පූර්ණ කරන්න.

(iv) ථූපාරාම ස්ථූපය හා රුවන්වැලි මහාසෑය කළ රජවරු දෙදෙනා නම් කරන්න.

(v) සතර අගති නම් කරන්න.

(vi) සුසුඛං වත ජීවාම - වේරිනේසු අවේරිනෝ

වේරිනේසු මනුස්සේසු - විහරාම අවේරිනෝ

මෙම ගාථාවෙන් හෙළි කරන ධර්ම කරුණු කුමක් ද?

(vii) පංචනීවර්ණ ධර්ම අතුරින් දෙකක් නම් කරන්න.

(viii) භික්ෂු ශාසනයේ ප්‍රථම වරට පැවිදි උපසම්පදාව ලබාගත් භික්ෂුව නම් කරන්න.

(ix) සිව්පසය නම් කරන්න.

(x) බුදුරජාණන් වහන්සේ දේශනා කළ සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස පහෙන් දෙකක් ලියන්න.

(ලකුණු 2 x 10 = 20)

(02) (i) සිගාලෝවාද සූත්‍රයේ දී දකුණු හා බටහිර දිශාව සඳහා උපමා කරනු ලැබුවෝ කවරහු ද?

(ii) දකුණු දිශා සමාජ කණ්ඩායමෙන් ඔබට ඉටුවිය යුතු යුතුකම් තුනක් ලියන්න.

(iii) සාර්ථක ගෘහ ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය පදනම බුදු දහමෙන් ඉගැන්වෙන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

(03) (i) ''උට්ඨානවතො සතිමතෝ'' යන ධම්මපද ගාථාව ලියන්න.

(ii) ඉහත ගාථාවේ අදහස ලියන්න.

(iii) ජීවිතයක් සාර්ථක කරගැනීමට බුදුරජාණන් වහන්සේගේ මෙම දේශනාව කෙතෙක් දුරට අදාල වේ දැයි විමසන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

(04) (i) ගර්භයේ ස්වරූපය අනුව ප්‍රධාන වශයෙන් ස්තූප සයාකාර වේ. ඉන් දෙකක නම් කරන්න.

(ii) බුබ්බුලාකාර ස්ථූපයක රූප සටහනක් ඇඳ එහි අංග නම් කරන්න.

(iii) ශ්‍රී ලාංකීය කලා ශිල්පීන්ගේ කලා කුසලතා අගයන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

(05) (i) සතර සංග්‍රහ වස්තු නම් කරන්න.

(ii) අර්ථචරියාව පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(iii) සාර්ථක නායකයකුවීමට ''සතර සංග්‍රහ'' වස්තුවලින් ලැබෙන පිටුවහල පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

(06) (i) චතුරාර්ය සත්‍ය නම් කරන්න.

(ii) සසර දුක තුන් ආකාර යැයි ධර්ම විවරණවල දැක්වේ. එය නම් කරන්න.

(iii) මිනිසුන් අසීමිත ආශාවන් නිසා දුකට පත්වන සැටි චතුරාර්ය සත්‍ය ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

(07) පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.

(i) දුටුගැමුණු මහ රජතුමා

(ii) ත්‍රිලක්ෂණය

(iii) සීලය

(iv) සඳකඩපහණ

(ලකුණු 5 + 5 = 10)

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **තෙවන වාර පරීක්ෂණය 2020**

**10 ශ්‍රේණිය** **බුද්ධ ධර්මය**

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(1) | 3 -(2) | 4 -(4) | 5 -(2) | 6 -(3) | 7 -(1) | 8 -(4) | 9 -(4) | 10 -(4) |
| 11-(2) | 12 -(3) | 13 -(3) | 14 -(2) | 15 -(4) | 16 -(2) | 17 -(1) | 18 -(3) | 19 -(4) | 20 -(3) |
| 21-(1) | 22 -(2) | 23 -(4) | 24 -(3) | 25 -(1) | 26 -(2) | 27 -(4) | 28 -(2) | 29 -(2) | 30 -(2) |
| 31-(1) | 32 -(3) | 33 -(3) | 34 -(1) | 35 -(3) | 36 -(4) | 37 -(1) | 38 -(4) | 39 -(1) | 40 -(4) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) (i) බරණැස ඉසිපතන මිගදායෙහි දී

(ii)
- අම්බට්ඨ සූත්‍රය - ඉච්ඡානංගල වනයේ වැඩ සිටිය දී
- සිංසප සූත්‍රය - ඇට්ටේරියා වනයේ වැඩ සිටිය දී

(iii) රහසත් පව් නොකොට
කෙලෙසරයනුත් දුරු කොට
නිසි වුයෙන් පුදට
අරහ යන නම කියති මුනිඳුට

(iv) ථූපාරාමය - දෙවන පෑතිස්ස (දේවානම්පිය තිස්ස රජු)
රුවන්වැලි මහා සෑය - දුටුගැමුණු මහ රජු

(v) ඡන්දය, ද්වේශය, භය, මෝහය

(vi) අපි වෛර කරන්නවුන් අතර අවෛරීව සුවසේ වාසය කරමු.

(vii) කාමච්ඡන්දය, ව්‍යාපාරදය, ථිනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච

(viii) අඤ්ඤාකොණ්ඩඤ්ඤ මහරහතන් වහන්සේ

(ix) චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස

(x)
1. මහත් වූ භෝග සම්පත් අත්පත් කර ගැනීම.
2. කීර්තිය පැතිරීම.
3. ඕනෑම පිරිසක් මැදට නිර්භය ව එළඹීමට හැකි වීම.
4. සිහි මුලා නොවී කලුරිය කිරීම.
5. මරණින් මතු සුගතියෙහි උපත ලැබීම.

(ලකුණු 2 x 10 = 20)

02. (i) * දකුණු දිසාව - ගුරුවරුන් * බටහිර දිසාව - ස්වාමි භාර්යාවන්

(ii) <u>ශිෂ්‍යා විසින් ගුරුවරයාට -</u>
1. දුටු විට හුනස්නෙන් නැගිටීම
2. අවශ්‍ය උපස්ථාන කිරීම
3. අවවාද අනුශාසනාවලට මැනවින් ඇහුම්කන් දීම
4. අවශ්‍ය කටයුතු ඉටුකර දීම
5. මැනවින් ඉගෙන ගැනීම

<u>ගුරුවරයා විසින් ශිෂ්‍යයන්ට -</u>
1. මැනවින් හික්මවීම.
2. මැනවින් ඉගැන්වීම.
3. දන්නා සියලු ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වීම.
4. තම මිත්‍රයන්ට ශිෂ්‍යා හඳුන්වා දීම.
5. ශිෂ්‍යයා ආරක්ෂා කර ගැනීම.

(iii) සිඟාලෝවාද සූත්‍රය ඇසුරු කරගනිමින් සැමියාගෙන් බිරිඳටත් බිරිඳගෙන සැමියාටත් විය යුතු යුතුකම් ඇතුළත් කරමින් දෙවියකු දෙවඟනක් සමඟ ජීවත් වනු දැකීම බුදුදහමේ අපේක්ෂාව බවද පෙන්වා දෙමින් පිළිතුර සපයා තිබීම වැදගත් වේ. (පිළිතුර සමස්තයක් ලෙස ගෙන ලකුණු පිරිනමන්න.)

(ලකුණු 2 + 3 + 5 = 10)

03. i. උට්ඨානවතෝ සතිමතෝ - සුචිකම්මස්ස නිසම්මකාරිනෝ
සඤ්ඤතස්ස ච ධම්මජීවිතෝ - අප්පමත්තස්ස යසෝභිවඩ්ඪති

ii. උත්සාහයෙන් ද නිවැරදි සිහියෙන් ද යුතු නිදොස් දේ විමසා බලා කරන තැන්පත් දැහැමි දිවි පැවතුම් ඇති නොපමා වූ පුද්ගලයාගේ කීර්තිය මනාව වැඩේ.

iii. 10 ශ්‍රේණිය 43 වන පිටුවේ සඳහන් කරුණු උපයෝගී කරගනිමින් පිළිතුර සපයා තිබීම වැදගත් වේ. ලියා ඇති පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු ලබා දෙන්න.


(ලකුණු 2 + 3 + 5 = 10)

## II කොටස - පිළිතුරු ඉතිරි කොටස

04. i. ගර්භයේ හැඩය අනුව ස්ථූප හයකට බෙදා දක්වේ.

01. ඝණ්ඨාකාර - ගණ්ඨාරයක (සීනුවක) හැඩය ඇති
02. ඝටාකාර - කළයක හැඩය ඇති
03. බුබ්බුලාකාර - දියබුබුලක හැඩය ඇති
04. ධාන්‍යාකාර - ධාන්‍ය ගොඩක හැඩය ඇති
05. පද්මාකාර - පියුමක හෙවත්, නෙළුම් මලක හැඩ ඇති
06. ආමලකාකාර - නෙල්ලි ගෙඩියක හැඩය ඇති (ල. 02)

ii.




- රූප සටහන ඇඳ කොටස් තුනක් නම් කර තිබේ නම් ලකුණු තුනක් දෙන්න. රූප සටහන පමණක් ඇඳ තිබේනම් හෝ නම් කිරීම පමණක් තිබේනම් ලකුණු දෙකක් දෙන්න.

iii. ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ප්‍රෞඪත්වය විදහාපාන කලා ශිල්ප අපේ කලා ශිල්පීන්ගේ විශිෂ්ට නිර්මාණයක් බව පෙන්වා දිය හැකිය. ඒ අතර වාස්තු විද්‍යාත්මක නිර්මාණ වූ ස්තූප, බුද්ධ ප්‍රතිමා, චිත්‍ර, මූර්ති, කැටයම්, ගෘහ නිර්මාණ දෙස් විදෙස් සැමගේ ඇගයීමට ලක්වන සුවිශේෂ නිර්මාණ බව පෙන්වා දිය හැකිය. (ඉහත කරුණු උපයෝගී කරගනිමින් පිළිතුරු සැපයීම ඉතා වැදගත් වේ. සමස්තයක් ලෙස ගෙන ලකුණු පිරිනමන්න.) (ලකුණු 2 + 3 + 5 = 10)

05. (i) දානය / ප්‍රිය වචනය / අර්ථ චරියාව / සමානාත්මතා

(ii) 10 ශ්‍රේණිය 22 පාඩමේ 128 පිටුවේ සඳහන් තොරතුරු අනුව ලකුණු ලබාදීම සිදු කරන්න.

(iii) පාලකයකු සතු විය යුතු වැදගත් ප්‍රතිපත්තියක් ලෙස හිමි සිව් සඟරාවත හඳුන්වා දිය හැකිය. එම ප්‍රතිපත්ති එකිනෙකට විස්තර කරමින් කරුණු දක්වා තිබීම ඉතා වැදගත් වේ. රටවැසියන් තමන්ගේ දරුවන් ලෙස සිතා කටයුතු කිරීමේ උතුම් මනෝභාවයක් ගොඩනැගේ. එවිට පිය පුතු සබඳතාවයෙන් යුතුව ජනතාව සේවය කිරීමේ අවස්ථාව පාලකයාට උදාවේ. (පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු ලබාදෙන්න.)

(ලකුණු 2 + 3 + 5 = 10)

06. (i) දුක්ඛ ආර්ය සත්‍යය
දුක්ඛ සමුදය ආර්ය සත්‍යය
දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය
දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය

(ii) 1. දුක්ඛ දුක්ඛතා
2. විපරිණාම දුක්ඛතා
3. සංඛාර දුක්ඛතා

(iii) ලියා ඇති පිළිතුර සමස්තයක් ලෙස ගෙන ලකුණු පිරිනමන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

07. ලියා ඇති පිළිතුරු සමස්තයක් ලෙස සලකා ලකුණු ලබාදෙන්න.

(ලකුණු 5 + 5 = 10)